# ජාතික ගමනාගමන කොමිෂන් සභාව.

## <u>අන්තර් පළාත් මගී සේවා අවසරපත්‍ර අයිතිය පැවරීම</u>

## පැවරුම්කරුවන් සඳහා උපදෙස් මාලාව.

### <u>1.ඉල්ලුම්පත්‍ර ලබා ගැනීම</u>

සියලුම පැවරුම්කරුවන් විසින් ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන **www.ntc.gov.lk** වෙබ් අඩවියට පිවිසීමෙන් මගී සේවා අවසරපත්‍ර අයිතිය පැවරීමේ ඉල්ලුම්පත්‍රය බාගත (DOWNLOAD) කර ගත යුතුය.

### <u>2.ඉල්ලුම්පත්‍ර භාරදීම.</u>

පහත ලබා දී ඇති උපදෙස් මාලාව අනුව සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍ර සහ ඊට අදාළ ලේඛණ ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.ntc.gov.lk වෙබ් අඩවිය වෙත පිවිස උඩුගත (UPLOAD) කිරීමෙන් අදාළ ඉල්ලුම්පත්‍ර බාරදීම සඳහා දිනයක් හා වෙලාවක් වෙන්කරවා ගත හැකිය.

**2.1සියලුම ඉල්ලුම්කරුවන් විසින් සිය ඉල්ලුම්පත්‍රය සමග පහත ලේඛණ ඉදිරිපත් කල යුතුය.**

1. අවසරපත්‍රය බාර දෙනු ලබන දින සිට ඉදිරියට මාස 03 ක් හෝ ඊට වඩා වැඩි කාලයක් සඳහා වලංගුව පවතින මගී සේවා අවසරපත්‍ර පොත, වින්ඩ්ස්ක්‍රීන් ලේබලය සහ ක්ෂේත්‍ර සන්නිවේදන කාඩ්පත **(NFC)** ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත භාර දිය යුතුය.
2. අවසරපත්‍රය සඳහා ආදේශ කර ඇති බස්රථයේ ලියාපදිංචි සහතිකය හා එහි ඡායා පිටපතක්
3. පැවරුම්කරුගේ ජාතික හැඳුනුම් පත හා එහි ඡායා පිටපතක් **(පැවරුම් කරු සමාගමක් නම් බලය ලත් නිලධාරීන් දෙදෙනා වෙන් වෙන්ව ලබා දිය යුතු වේ)**
4. 2026 අංක 1 දරන මගී සේවා අවසරපත්‍ර පැවරීමේ නියෝග සහිත ගැසට් නිවේදනයේ II උපලේඛණයේ ඇමුණුමේ දක්වා ඇති ආකෘතියට සාරානුකුල වූ දිවුරුම් ප්‍රකාශය **(පැවරුම්කරු සමාගමක් නම් බලය ලත් නිලධාරීන් දෙදෙනා වෙන් වෙන්ව ලබාදිය යුතුවේ/පැවරුම්කරු මියගොස් ඇතිනම් අදාළ නොවේ.)**
5. පැවරුම් කරුගේ විදේශ ගමන් බලපත්‍ර ප්‍රමාණයේ (3.5cm*4.5cm) වර්ණ ඡායාරූපයක් **(පැවරුම් කරු සමාගමක් නම් බලය ලත් නිලධාරීන් දෙදෙනා වෙන්ව ලබා දිය යුතු වේ)**
6. පැවරුම්කරු සමාගමක් නම් සමාගම සංස්ථා ගත කිරීමේ සහතිකය, සාංගමික ව්‍යවස්ථාවලිය හා එහි ඡායා පිටපතක්
7. පැවරුම්කරු සමාගමක් නම් මගී සේවා අවසරපත්‍රය පැවරීමට අවසර ලබාදුන් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මතය හා එහි ඡායා පිටපතක්
8. සාක්ෂිකරුවන් දෙදෙනාගේ ජාතික හැඳුනුම්පත් වල සහතික කරනලද ඡායා පිටපත්

**2.2.** **මගී සේවා අවසරපත්‍ර හිමිකරු මියගොස් ඇති අවස්ථාවකදී අදාළ ඥාතීත්වය තහවුරු කරනු ලබන පහත සඳහන් ලේඛණ ඉල්ලුම් කරු විසින් ඉල්ලුම්පත්‍රය සමග ඉදිරිපත් කල යුතුය.**

1. මගී සේවා අවසරපත්‍ර හිමිකරුගේ මරණ සහතිකයේ ගේ මුල් පිටපත හා එහි සහතික පිටපතක්.
2. මියගිය අවසරපත්‍ර හිමිකරු සමග පැවති ඥාතීත්වය/සම්බන්ධතාවය තහවුරු කරෙන ලේඛණ වල මුල් පිටපත් හා එහි සහතික පිටපත් සහතික **(උප්පැන්න සහතික,විවාහ සහතික)**
3. පැවරීම බලාත්මක කිරීමට විධානය කරනු ලබන නඩු තීන්දුවේ සහතික පිටපතක් සහ අධිකරණය විසින් ප්‍රදානය කරන ලද ප්‍රොබේට් බලපත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය.**(පැවරුම්කරු මියගොස් ඇති අවස්ථාවන්හිදී /අවසරපත්‍රයේ හිමිකමට අදාලව කිසියම් අධිකරණ කටයුත්තක් සිදුවන්නේ නම් පමණි)**
4. සාක්ෂිකරුවන් දෙදෙනාගේ ජාතික හැඳුනුම්පත් වල සහතික කරනලද ඡායා පිටපත්

**2.3.** **මීට අමතරව අයිතිය පැවරීම සඳහා ඉල්ලුම් කරනු ලබන මගී සේවා අවසරපත්‍රය සම්බන්ධයෙන් පහත දක්වා ඇති කොන්දේසි සපුරා තිබිය යුතුය.**

**1.** පැවරීම සඳහා ඉල්ලුම් කරනු ලබන මගී සේවා අවසරපත්‍රයට අදාලව කිසියම් අධිකරණ කටයුත්තකින්,මහජන පැමිණිල්ලකින්, ආයතනික විමර්ශනයකින්, කොන්ත්‍රාත්තුවකින්, ගිවිසුමකින් හෝ වෙනත් නෛතික බැඳීමකින් මුක්ත විය යුතුය.

2. අවසරපත්‍රය සම්බන්ධයෙන් වන යම් ගාස්තු,ලොග් පත්‍ර / පිවිසුම් පත්‍ර ගාස්තු දඩ මුදල්, හෝ වෙනත් යම් ගෙවීම් හිඟයකින් තොරව නිසි පරිදි පියවා තිබිය යුතුය.

**3.** අයිතිය පැවරීම සඳහා ඉල්ලුම් කරනු ලබන මගී සේවා අවසරපත්‍රය සම්බන්ධයෙන් පැවරුම්කරු විසින් කොමිෂන් සභාව වෙත හෝ අන්‍යාකාරයකින් හෝ ඉදිරිපත් කරන ලද යම් ලියාපදිංචි ඇටෝර්නි බලපත්‍රයක් වේ නම් එහි අවලංගු කිරීමට අදාළ ලේඛණ ඉදිරිපත්කල යුතුය.

4. යෝජිත පැවරුම්ලාභියා නමින් පැවරීම සිදුකිරීමට ඉල්ලුම් කරනු ලබන අවසරපත්‍රයට අදාළ ධාවන මාර්ගයේ ජාතික ගමනාගමන කොමින් සභාව විසින් නිකුත් කර ඇති මුළු අවසරපත්‍ර ගණනින් යෝජිත පැවරුම් ලාභියා නමින් නිකුත් කර ඇති අවසරපත්‍ර සංඛ්‍යාව 25% නොඉක්මවා තිබිය යුතුය. යුතුය.

5. ඉල්ලුම්පත්‍ර භාරදීමේදී 2026 අංක 1 දරන මගී සේවා අවසරපත්‍ර පැවරීමේ නියෝග සහිත ගැසට් නිවේදනයේ III උපලේඛණයේ දක්වා ඇති පරිදි වලංගු මගී සේවා අවසරපත්‍රයක් පැවරීම සඳහා කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබා ගැනීමේ ගාස්තුව වන රුපියල් 5,000.00 ක ගාස්තුව පැවරුම් කරු විසින් ගෙවිය යුතුය.

**.** කලින් වෙන්කරවා ගත් දිනයේදී පමණක් ඉල්ලුම්පත්‍ර භාරගැනීම සිදුකරනු ලබන බව කරුණාවෙන් සලකන්න.**

**ජාතික ගමනාගමන කොමිෂන් සභාව**
**ක්ෂණික ඇමතුම්:1955**
දුරකථන **- 2587372** ෆැක්ස් **- 2058138**